# අයියනායක

වයඹ පළාත ආශ්‍රිත වන්නි හත්පත්තුවේ ගැමියන් අතර අදටත් තමන්ගේ අඹුදරුවන්, ගේ දොර, හරකබාන, ගහකොල භවබෝග ඇතුළු තමන් සන්තක සකලවිධ නිශ්චල හා චංචල දේපල වලට රැකවරණය පතන්නේ අයියනායක දෙවියන්ගෙනි.

නවසිය හතලිහ දශකයේ අග භාගයේ එම පළාතේ ප්‍රාදේශීය ආදායම් පාලකවරයා වශයෙන් සේවය කළ විමලරත්න කුමාරගම මහතා විසින් ලියන ලද අයියනායක කවිපෙළ මඟින් ගොවිකම ගැමිකම හා අපේකම මෙන්ම වියලි කළාපයේ වනගත ගම්මානයක කටුක ගැමි දිවිය අපේ හදවත් වලට සමීප කරවයි.

සෙවණැලි අවදි නොමවන වැව් ඉවුරු කොනේ  සංහිඳ ළඟ බාරයට කිරි ඉතිරීම
කාලය විසන් හෑරූ නුග ගසක බෙනේ  කෙම්මුර දවස් වල පානින් සැරසීම
මලකා කළුව ගිය ආයුධ කැබලි පෙනේ  වන අතු කඩා ගස් දෙබලක දැවටීම
දෙවියෙක් නැතද මෙහි බලයක් තිබෙනු දැනේ  මා නොකෙරුවත් නොකලෙම් එය ගැරහීම

බුධ ගුරු සනි හිරුට හිමි හැම දවස් වල  සාගත වසංගත හා එන නියඟ වලින්
මේ සංහිඳේ එළියක් ඇත සවස් කළ  සහනය පතා වන දෙවියන් ලඟට කෙලින්
ලෙඩ දුක් වලින් මිදුමට බාරයක් කළ  එන මේ පිරිස සැරසීමට නුවන මලින්
හැමදෙන එතන රැස්වෙති ගම ගෙවල් වල  පෙළඹෙන අයට අනුකම්පා කරමි මුලින්

වනපෙත දැවෙන විට වැද මළ හිරුගෙ රත  ගංගොඩ වටා මෝරණ වන ලැහැබ මැන
ගණදුර වසන විට ආලෝකයෙහි නෙත  අහුමුළු නෑර සිය අනසක පතුරු වන
සඳරැස් ගලන විට තෙරපී සෙවණ මත  බලවත් අයියනායක දෙන ගොදුරු ගෙන
එක් දෙවියෙක් නොවේ දාහක් එතන ඇත  මේඅය රකිනුමැන යන එන සියලු තැන

දෙවිදේවතාවුන් සැරිසරන මහවනේ  මාපිල් පිඹුරු හා පොළඟුන් සිටින තැන
පවතින බලය ඇඟලොම්තුඩකට ද දැනේ  අලි කොටි වලස් මුළු කොළ හල කරන තැන
මොළයෙන් තමා ලෝකේ සුවය වැනසුනේ  නිතරම ඔබ පුදන මේ අය හැඳින ගෙන
මගෙ ගැරහුමට නැත ඒ පිරිස යොමුවුනේ  බලවත් දෙවි තුමනි දිව රෑ රකිනු මැන

පාඨශාලාචාර්ය ජී. අජිත් වීරසිංහ
නාරංගල්ලේගම විද්‍යාලය,
සේනපුර